සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

# ඉස්ලාම් ධර්මය

7 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- වඩාත්ම සුදුසු වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

01 ආදම් (අලෛ) තුමාණන්ගෙන් පසු යවනු ලැබූ නබිවරයා කවුද?

(i) නූහ් (අලෛ) (ii) ෂීදු (අලෛ)

(iii) ඊසා (අලෛ) (iv) මූසා (අලෛ)

02 නබි (සල්) තුමාණන් සෘජුවම සහභාගිවුණ සටන් කුමන නමකින් හඳුන්වනුලබයි ද?

(i) හර්බ් (ii) කිතාල්

(iii) කිසාස් (iv) කසවාත්

03 ''දික්ර්'' යනු කුමක් ද?

(i) අල්ලාහ් මෙනෙහි කිරීම. (ii) පව් ක්‍ෂමාව

(iii) දේව තෘප්තිය (iv) ප්‍රාර්ථනාව

04 ඉස්ලාමයෙහි දෙවන මූලාශ්‍රය කුමක් ද?

(i) ඉජ්මා (ii) අල් කුර්ආන්

(iii) ෆික්හ් (iv) සුන්නා

05 ''ඒක දේවවාදය'' යන අර්ථය සඳහන්කරවන අරාබි පදය

(i) මආද් (ii) තව්හීද්

(iii) රිසාලත් (iv) නුබුව්වත්

- **පහත කියමන් නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

06 රසුල්වරුන් විශ්වාස කිරීම ඊමානයෙහි හතරවන අංගය වේ. ( )

07 පරිශුද්ධ කුර්ආනයෙහි මුලින්ම පහළකරන ලද වචනය අන්තර්ගත වගන්තිය අයත් සූරාව සූරා අලක් වේ. ( )

08 බිලාල් (රළි) තුමාණන්ගේ හාම්පුතා ''උමෛයා ඉබ්නු හලබ්'' වේ. ( )

09 නබි නූහ් (අලෛ) තුමාණන්ගේ නැව හිමාලය තරණය කළේය. ( )

10 තමන් බේරාගත් මුස්ලිම් ස්ත්‍රියට සිහිවටනය වශයෙන් දෙවන රාජසිංහ රජු විසින් බංගරගම්මන යන ගම එතුමියගේ නෑදෑයන්ට පරිත්‍යාග කළේය. ( )

- **ගැලපෙන පරිදි යා කරන්න.**

| | | |
|---|---|---|
| 11 | සුහෛබ් (රළි) | • නබි (සල්) තුමාණන්ගේ මුනුපුරන් |
| 12 | හසන්, හුසෛයින් | • උම්මහාතුල් මුඃමිනීන් |
| 13 | මුහාජිර්වරුන්ට උදව් වූ අය | • රෝම දේශය |
| 14 | විශ්වාසයින්ගේ මාතාව | • උම්මු සල්මා |
| 15 | හින්ද් | • අන්සාරිවරුන් |

- **පහත දී ඇති වචනවලින් සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

[ බිලාල් (රළි) / මූසා (රළි) / මෛකල් එච්. හාර්ට් / සහීපතුල් මදීනා / උමර් (රළි) / අබූබකර් (රළි) / ඊසා (අලෛ) ]

16 මදීනා සම්ප්‍රාප්තියත් සමග නබි (සල්) තුමාණන් යුදෙව්වරුන් සමග සිදුකරගන්නා ලද ගිවිසුම ............................................................... ලෙස හඳුන්වයි.

17 ''The Hundred'' නායකයන් සියදෙනා යන ග්‍රන්ථය ............................................................... රචනා කළේය.

18 ............................................................... ඔවුන් කඃබාවෙහි මුලින්ම අසාන් පැවසුවේ ය.

19 හෆ්සා (රළි) තුමිය ............................................................... තුමාණන්ගේ දෝනි වේ.

20 වේදය හා සුහුෆ් හිමිවූන ............................................................... අය වූහ.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01 කෙටි පිළිතුරු සපයන්න.

(1) ''අව්රත්'' යනු කුමක් ද?

(2) මදීනාවෙහි ජීවත්වූ අරාබි පෙලපත් දෙගොල්ල කවුරුන් ද?

(3) කබ්ර්හි ප්‍රශ්න ඇසීම සඳහා වගකිවයුතු මලාඉකාවරුන් දෙදෙනා කවුරුන් ද?

(4) සාමාන්‍ය නජීසයට උදාහරණ දෙකක් සඳහන් කරන්න.

(5) ඊමානයෙහි වර්ග දෙක සඳහන් කරන්න.

(6) ''ලැජ්ජාව'' සම්බන්ධව පැවසෙන හදීසයක් සඳහන් කරන්න.

(7) පොදු වත්කම් දෙකක නම් ලියන්න.

(8) ''දික්ර්'' හි වර්ග සඳහන් කරන්න. (ලකුණු $2 \times 8 = 16$)

02 (1) ඊමානයෙහි ප්‍රධාන කොටස් සඳහන් කරන්න. (ලකුණු 03)

(2) අප ඊමාන් කළයුතු කාරණයන්හි 4 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) අල්ලාහ්ට වාජිබ් ගුණාංග වලින් සතරක් ඒවායෙහි තේරුම් සහිතව ලියන්න. (ලකුණු 04)

03 (1) 'නජීස්' හි කොටස් සඳහන් කරන්න. (ලකුණු 03)

(2) මිත්‍රත්වයක් ගොඩනැගීමේදී සැලකිය යුතු මූලික කරුණු හතරක් ලියන්න. (ලකුණු 04)

(3) පරිශුද්ධ ග්‍රන්ථ හතර සහ ඒවා පහළකරන ලද නබිවරුන් නම් කරන්න. (ලකුණු 04)

04 (1) නබි (සල්) තුමාණන්ගේ කාල සමයේ 'මස්ජිද් නබවි' යෙහි සිදුකළ සේවාවන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(2) ඉස්ලාම් පවසන සටන් ආචාර ධර්මයන් හතරක් ලියන්න. (ලකුණු 04)

(3) බිලාල් (රළි) පිළිබඳව කෙටියෙන් ලියන්න. (ලකුණු 04)

05 (1) නූහ් (අලෛ) තුමාණන්ගේ කාල සමයේ සිටිය විද්වතුන් තුන්දෙනෙකුගේ නම් සඳහන් කරන්න. (ලකුණු 03)

(2) ගැහැණු, පිරිමි අව්රතයන්හි පිළිවෙත සඳහන් කරන්න. (ලකුණු 04)

(3) ගෙදර අවට පරිසරයෙහි අනුගමනය කළයුතු කරුණු හතරක් දෙන්න. (ලකුණු 04)

06 (1) තම නම සමග මව් රටත් සම්බන්ධකර ආමන්ත්‍රණය කළ නබිතුමාණන්ගේ මිතුරන් තුන්දෙනෙකුගේ නම් ලියන්න. (ලකුණු 03)

(2) අප මව්රට වෙනුවෙන් ඉටුකළ යුතු වගකීම් හතරක් ලියන්න. (ලකුණු 04)

(3) පොදු සම්පත් අවභාවිතයෙහි ප්‍රතිවිපාක දෙකක් දෙන්න. (ලකුණු 04)

07 (1) ඉස්ලාමය වෙනුවෙන් අම්මාර් (රළි) තුමාණන් මුහුණදුන් අභියෝග තුනක් ලියන්න. (ලකුණු 03)

(2) අම්මාර් (රළි) තුමාණන් සම්බන්ධයෙන් මුහම්මද් නබි (සල්) තුමාණන් කළ ප්‍රකාශයක් දෙන්න. (ලකුණු 04)

(3) පහත වචනවල අර්ථයන් ලියන්න.

(අ) අලක් (ආ) අහද් (3) සහාබාවරුන් (4) ෂිර්ක් (ලකුණු 04)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) 2 (02) 4 (03) 1 (04) 4 (05) 2 (06) ✗ (07) ✓ (08) ✓

(09) ✗ (10) ✓ (11) රෝම දේශය (12) නබි (සල්) තුමාණන්ගේ මුනුපුරන්

(13) අන්සාරිවරුන් (14) උම්මහාතුල් මුඃමිනින් (15) උම්මු සල්මා (16) සහීපතුල් මදීනා

(17) මයිකල් එච්. හාර්ට් (18) බිලාල් (රළි) (19) උමර් (රළි) (20) මූසා (අලෛ)

## II කොටස

01 (1) පිරිමි, ගැහැණු ශරීරයෙහි අනිවාර්යයෙන්ම ආවරණය කළයුතු කොටස්
(2) අව්ස්, හස්රජ්
(3) මුන්කර් (අලෛ) / නකීර් (අලෛ)
(4) මුත්‍රා, මලපහ, ලේ, ශුක්‍රාණු, මැරුණු සතුන්ගේ ශරීර
(5) ඊමාන් මුජ්මල් - කෙටි ඊමානය / ඊමාන් මුෆස්සල් - පුළුල් ඊමානය
(6) * ඊමාන් 60 ට වඩා හෝ 70 ට වඩා කොටස් ඇත. එහි උසස් 'ලා ඉලාහ ඉල්ලල්ලාහු' වේ. එහි පහළ මට්ටම පාරෙහි අවහිර දෑ තුරන් කිරීම, ලැජ්ජාව ඊමානයෙහි අංගයක් වේය. (බුහාරි, මුස්ලිම්)
* ලැජ්ජාව හා ඊමානය එකිනෙක සම්බන්ධ වේ. එකක් අහිමි වුනොත් අනෙකත් අහිමි වේ. (හාකිම්)
* ලැජ්ජා සිතුවිලි සැමවිට හිතකර දේවල්ම ගෙනඒවි (බුහාරි) (මුස්ලිම්)
* කිසියම් ක්‍රියාවක ලැජ්ජාව පවත්වාගෙන යනවදෝ, එය එම ක්‍රියා අලංකාර කරවයි. එලෙසම කිසියම් ක්‍රියාවක ලැජ්ජාව අහිමිවේදෝ එය එම ක්‍රියාව හානිකරවයි. (තිර්මිදි) ලැජ්ජාව ඊමානයෙහි ඇත යනුවෙන් කිසියම් හදීසයක් ........
(7) පාසල්, රෝහල්, පාරවල්, දුම්රිය ස්ථාන, ගංගා, මුහුදු වෙරළ, උද්‍යානයන්, මස්ජිද් යනාදිය
(8) දික්ර් කල්බි, දික්ර් ලිසානි

02 (1) තව්හීද්, රිසාලත්, මආද් (ල. 03)
(2) අල්ලාහ්ව, මලාඉකාවරුන්ව, පරිශුද්ධ ග්‍රන්ථ, රසූල්වරුන්, අවසන් විනිශ්චය දිනය, කද්ර් (ල. 04)
(3) වාජිබ් ගුණාංග හතරක් තේරුම් සමග ලියවී ඇත්නම් (ල. 04) (තේරුම පමණක් ලියවී ඇත්නම් $4 \times \frac{1}{2} = 02$)

03 (1) දැඩි නජීස්, සාමාන්‍ය නජීස්, සැහැල්ලු නජීස් (ල. 03)
(2) දේව විශ්වාසකයකු වීම / අල්ලාහ් වෙනුවෙන් ආදරය කිරීම / දේව භක්තිය (බිය, බැතිකම) / යහපත් ක්‍රියා / යහපත් දෑ අණකර අයහපතින් වැළකීම (ල. 04)
(3) තව්රාත් - මූසා (අලෛ) / සබූර් - දාවුද් (අලෛ) / ඉන්ජීල් - ඊසා (අලෛ) / ෆුර්කාන් - මුහම්මද් (සල්) (ල. 04)

04 (1) ජමාඅත් සලාතය / ආරාවුල් විසඳන ස්තානයක් ලෙස / විදේශීය දූතවරුන් පිළිගැනීමේ ස්ථානයක් ලෙස / දුප්පතුන්ට, අසරණයින්ට අත්‍යවශ්‍ය අයට සහනාධාර ලබාදෙන ස්ථානයක් ලෙස / දැනුම වර්ධනය කරන ස්ථානයක් ලෙස (ල. 03)
(2) * බලයෙන් අසාධාරණ සිදුකරන අය සමග පමණක් සටන් කළ යුතුය.
* සාමාන්‍ය ජනතාවට පහර දෙන්න බැහැ.
* කාන්තාවන්, ළදරුවන්, වැඩිහිටි අයට පහර දෙන්න බැහැ.
* හරිත ශාක, පලතුරු ගස්, වගා බිම් විනාශ නොකළ යුතුය.
* විරුද්ධවාදියාට වධ හිංසා කිරීම, විරූපණය කිරීම තහනම්
* පූජනීය ස්ථාන, පූජකවරුන් අහිමිකරවීම තහනම්
(3) * පියා - රබාහ්, මව - හමාමා * වහලෙක් * මුලින්ම අදාන් පැවසුවේ ය
* එළුවන් රැකීම

05 (1) වද්දූ, සුවාඋ, යඌස්, නස්රු, යඌක්
(2) පිරිමි - පෙකනිය සිට දණහිස තෙක්
ස්ත්‍රිය - මුහම්, මැණික්කටුව රහිතව අනෙකුත් ශරීරයේ සෑම කොටසක්ම ආවරණය
(3) * නිවසට ඇතුල්වීමේ දී සලාම් පැවසීම * නිවසට ඇතුළුවීමේ දී දුආ පැවසීම
* නෑදෑයන් සමග සහෝදරත්වයෙන් කටයුතු කිරීම * පරිත්‍යාගශීලීත්වය, පුණ්‍ය කටයුතු සිදුකිරීම
* ඉවසිලිමත්ව කතාකිරීම යන ගුණාංගයන් අනුගමනය කිරීම
* සැමදා ගෙදර පරිසරය හා නිවස පිරිසිදුවට තැබීම
* නිවසෙහි භාවිත වන බඩු භාණ්ඩ පිළිවලට, අලංකාරව හා පිරිසිදුව තබාගැනීම

06 (1) බිලාල් අල් හබෂි / සුහෙබ් අර්රූම් / සල්මාන් අල් ෆාරිස් / හුදෛෆතුල් යමානි
(2) මව් රට වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීම / රටේ ජනතාවට ආදරය කිරීම / ජනතාවගේ යහපත වෙනුවෙන් මහන්සි වීම / මතුවන ප්‍රශ්නවලට රට ආරක්ෂාකර ගැනීමට හා මුදවාගැනීමට කටයුතු කිරීම / රටේ නීතියට ගරුකිරීම /නිදහස, ආරක්ෂාව, සංවර්ධනය, අධ්‍යාපනය, සෞඛ්‍යය හා නිරෝගී දිවිය, සහජීවනය යන දේවල්වල සංවර්ධනය උදෙසා කටයුතු කිරීම.
(3) ඛෛබර් සටනේදී උඩු වස්ත්‍රය සොරකම් කළ ෂහීද්ගේ කතාව ලියවී ඇත්නම් ලකුණු දෙන්න.

07 (1) * රත්කර ඇඳුම් අන්දවා පිච්චෙන ගින්නෙහි දැමීම.
* තද පිච්චෙන පොළවෙහි වස්ත්‍රයක් නොමැතිව පිච්චෙන්න ඉඩහැරීම.
* ගින්නෙන් වේදනා
*
* ජලයෙහි හිස ගිල්වා හුස්ම හිරවන්නට සැලැස්වීම.
(2) ''අම්මාර්ගේ දේව බිය, බැතිකම ඒතුමාගේ ශරීරය පුරා ව්‍යාප්තවීම''
''කව්රුන්ද අම්මාර්ව තරහ කරගන්නේද ඔහු අල්ලාහ්ව තරහ කරගන්නේ ය.
(3) (අ) ලේ කැටිය (ආ) කෙනෙකු (ඉ) නබි සගයන් හා යහළුවන් (ඊ) ආදේශ කිරීම